- ***බදු අයින් කරලා තෙල් මිල අඩු කරනවා කියපු "සූර සරදියල්ලා" අද ආණ්ඩුව අරන් අපි අතීත කතා අමතක කරලා...***

- ***පැරණි තොගවලින් බිලියන 15ක අයුතු ලාභයක් ලබමින් ජනතාව පීඩාවට පත් කරලා***

- ***බුද්ධි අංශ ප්‍රධානී සලේ මීයන් කැරපෙත්තන් පිරි ගඳ ගසන අපිරිසිදු සිරකුටියක නිරාහාරව තබා රෝගියෙක් කර මරා දාන්න සැලැස්මක්...***

## ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශගෙන් විශේෂ හෙළිදරව්වක්

ඉන්ධන මිල අසාධාරණ ලෙස ඉහළ දැමීම හරහා වත්මන් රජය ජනතාව මත දැඩි පීඩනයක් පටවා ඇති බවත්, විපක්ෂයේ සිටියදී බදු අඩු කරන ලෙස හඬ නැඟූ පිරිස් අද බලයට පැමිණ පරණ පොරොන්දු අමතක කර "බබා පාටර්" දමමින් සිටින බවත් ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතා අද (11) බත්තරමුල්ලේ පැවති විශේෂ මාධ්‍ය සාකච්ඡාවකදී කියා සිටියේය.

වත්මන් රජයේ නායකයින් පසුගිය කාලයේ "ඉන්ධන මිල සූත්‍රය" සහ බදු ගැන කළ ප්‍රකාශ රැසක් මෙහිදී හඬපට මගින් ප්‍රදශර්නය කරමින් එහිදී අදහස් දැක්වූ වීරවංශ මහතා කියා සිටියේ, එදා වැට් බදු සහ අනෙකුත් බදු අයින් කර පාරිභෝගිකයාට සහන දිය හැකි බව කී නායකයින්, අද බදු බර තවත් වැඩි කර ඇති බවයි. විජිත හේරත් එදා කළ ප්‍රකාශයක් ඔහු මෙසේ ඉදිරිපත් කළේය.

"තෙල් මිල අඩු කරන්න බැරිද? පුලුවන්... ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මේ මාසේ වෙනකොට තෙල් ආනයනය කරලා ලංකාවට පෙට්‍රෝල්, ඩීසල්, ලාම්පුතෙල් ලීටරයක් ගොඩබාන මිල ගණන් තියෙනවා. හරි පැහැදිලිව ඒකේ කියනවා ඔවුන්ගේ වාතර්ාවලම; "පෙට්‍රල් 92 ලීටරයක් ගොඩබාන මිල රුපියල් 97යි සත 70ක්. ඒකට විවිධ අයකිරීම් එකතු වෙනවා. ඒ එකතු කිරීමට අමතරව ආණ්ඩුව සෘජුව බද්දක් ගහනවා රුපියල් 39යි සත 33ක්. එතකොට පෙට්‍රල් 92 වලට රුපියල් 39.33ක බද්දක් ගහනවා. පෙට්‍රල් 95 ලීටරේ ගොඩබන මිල රුපියල් 99යි සත 79යි, ආණ්ඩුව සෘජු බද්දක් ගහනවා රුපියල් 60යි සත 45ක්. ලංකා ඔටෝ ඩීසල් 94යි සත 21ට ගොඩබන්නේ; රුපියල් 13යි සත 7ක බද්දක් ගහනවා. ලංකා

සුපර් ඩීසල් ගොඩබන්නේ රුපියල් 96යි සත 2 කට; රුපියල් 35යි සත 20ක බද්දක් ගහනවා.*" (විජිත හේරත්)*

මිල වැඩි කරන මොහොත වන විට මෙරට පිරවුම්හල්වල පැරණි මිලට ගෙනා ඉන්ධන ලීටර් මිලියන 650ක් පමණ තිබුණ බව ආරංචි මාගර් තුළින් ගෙන හැර පෑ වීරවංශ මහතා එම තොග හරහා පමණක් රජය සහ සමාගම් රුපියල් බිලියන 15කට වැඩි අයුතු ලාභයක් උපයා තිබෙන බව කීවේය. මෙය "හදවතක් නැති ජාවාරම්කාරී වැඩක්," යැයි ඔහු වැඩිදුරටත් පැවසීය. ලෝක වෙළෙඳපොළේ තෙල් මිල අඩුවන විට එහි වාසිය ජනතාවට නොදී, සංචිතවල ඇති තෙල්වලින් පවා ලාභ ලැබීම හිරිකිත ක්‍රියාවක් බව ද ඔහු අවධාරණය කළේය.

"දැන් බලන්න මේගොල්ලෝ මීට කලින් කිව්වේ මේ මාසයේ ලෝක වෙළඳපොළේ තෙල් මිල ගැලපෙන්නේ ලබන මාසෙට කියලා. දැන් මේ මාසයේම ඊට කලින් තෙල් මිලේ වෙනසක් කළා. එතකොට මේ මාසේ නැවත සූත්‍රය දාලා තෙල් මිල වෙනස් වෙන්න විදිහක් නැහැ. එතකොට මේ මාසේ ලෝක වෙළඳපොළේ වැඩිවීමක් තියෙනවා නම්, ඇත්තටම ඔය කියන දවසට වඩා දැන් අඩුයි. එකසිය ගණන්වලට තිබ්ච්ච බැරල් එක දැන් 80 ගණන්වලට අඩු වෙලා තියෙනවා. ඩොලර් 80 ගණන්වලට.

එතකොට දැන් ඒ අඩුවීම ගැන කතා කරන්නේ නැහැ. මේ අය තමයි කිව්වේ 'මේ මාසේ තියෙන මිල ලබන මාසෙටයි අපි ගලපන්නේ' කියලා. එතකොට දැන් මේගොල්ලොන්ගේ සංචිතවල තෙල් තිබුණා. ඒ වගේම ආවේ පරණ මිලට. ඊළඟට පෙට්‍රල් ෂෙඩ් වල - ඒ කියන්නේ අපි දන්නවා IOC එකේ ගත්තත්, පෙට්‍රෝලියම් එකේ ගත්තත් - දවස් 20ක හෝ ප්‍රමාණයකට අඩුම තරමේ තෙල් තියෙනවා පරණ මිලට ගෙනාපු."

නොරොච්චෝලේ බලාගාරයේ පවතින අකාර්යක්ෂමතාව වසා ගැනීමට රජය විසින් පූර්ව අනතුරු ඇඟවීමකින් තොරව "හදිසි විසන්ධි වීම්" ලෙස හඳුන්වමින් විදුලිය කපන බවට ද ඔහු චෝදනා කළේය. "එදා තෙල් ළිං ගැන ප්‍රශ්න කරපු අය දැන් කියනවා තමන්ට තෙල් ළිං නැහැ කියලා. බඳු අඩු කරලා පෙන්වන්න කියලා අපි අභියෝග කරනවා," යැයි වීරවංශ මහතා කීය.

මාධ්‍ය හමුවේ දෙවන හෙළිදරව්ව කරමින් හිටපු රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී සුරේෂ් සලේ මහතා රඳවා තබාගෙන සිටින අමානුෂික තත්ත්වය පිළිබඳව වීරවංශ මහතා කරුණු ඉදිරිපත් කළේය. "රාජ්‍යයේ ඇස ලෙස ක්‍රියා කරපු, රටේ ආරක්ෂාව වෙනුවෙන් කැපවුණු බුද්ධි ප්‍රධානියා අද රඳවා තබාගෙන ඉන්නේ මීයන් ගැවසෙන, අපිරිසිදු සිරකුටියක. ඔහුට නිදාගන්න පැදුරක් පවා නැහැ. යාබද වැසිකිළියේ ගඳ නිසා ඔහුට ආහාර ගැනීමට පවා නොහැකි වී තිබෙනවා," යැයි ඔහු පැවසීය.

මෙය ශානි අබේසේකර ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් දියත් කර ඇති දේශපාලන පළිගැනීමක් බවත්, බුද්ධි ප්‍රධානියා රෝගියෙකු කර මරා දැමීමට දරන උත්සාහයක් බවත් ඔහු චෝදනා කළේය.

මෙම මදර්නයට එරෙහිව නිහඬව නොසිටින ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටි වීරවංශ මහතා, ඉදිරි දිනකදී රහස් පොලීසිය ඉදිරිපිට අඛණ්ඩ විරෝධතාවයකට සූදානම් වන බවත්, ඒ සඳහා "නතර වීමේ බලාපොරොත්තුවෙන්" පැමිණෙන ලෙසත් රටේ ජනතාවට විවෘත ආරාධනයක් කළේය.

***<u>ජාතික නිදහස් පෙරමුණේ නායක</u>***

***<u>විමල් වීරවංශ මහතා විසින් සිදු කරන ලද හෙළිදරව්ව</u>***

***<u>සම්පූර්ණ පිටපත මෙසේය.</u>***

‘‘සුභ උදෑසනක් මාධ්‍යවේදී ඔබ සියලු දෙනාට. මේ මාධ්‍ය සාකච්ඡාව පවත්වන්න ප්‍රධාන හේතු කාරණා දෙකක් බලපා තිබෙනවා. පළමුව යන්න කෙරෙහි මම ඔබගේ අවධානය මුලින්ම යොමු කරන්නම්. අපි කවුරුත් දන්නවා ඊයේ ඉතාමත්ම හදිසියේම මේ රටේ ‘‘ඉන්ධන මිල අතිශය විශාල අගයකින් ඉහළ දැමීමක්’’ රජය මගින් සිදු කළා. අරුම පුදුම කතාව වෙන්නේ මේක ඉහළ දැම්මම සමහර ඇමතිවරුන්ගෙන් ඇහුවම ‘‘නෑ ආණ්ඩුවෙන් නෙවෙයි ඒක කළේ... සී පී සී එක’’ කියලා කියනවා. 'සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන් එකෙන්'. ඒගොල්ලොන්ට අනුව සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන් රජයේ ආයතනයක් නෙවෙයි, බලශක්ති අමාත්‍යවරයාගේ යටතේ පවතින ආයතනයක් නෙවෙයි.

දැන් මේ වගේ ‘‘බූරු කතා කියලා මේ රටේ මිනිස්සුන්ව තවත් ප්‍රකෝප කරන්න එපා’’ කියලා පළමුකොටම අපි ඒ ඇමතිවරුන්ගෙන් ඉල්ලා ඉන්න ඕනේ. ඒ වගේම මේ රට කෝවිඩ් වසංගතයට මුහුණ දීලා තියෙද්දී, ලෝකයේ සැපයුම් මාගර් බිඳ වැටිලා තියෙද්දී, එදා තෙල් මිල ඉහළ යනකොට ඒ ස්වභාවික විපත, ඒ සෞඛ්‍යමය ගැටලුව යටතේ පවා මේ ආණ්ඩුවේ මහත්තුරු ඒවට ප්‍රතිචාර දැක්වූයේ ඔය කියන මේ රාජතාන්ත්‍රික භාෂාවෙන් නෙවෙයි.

ඒගොල්ලෝ ඒ ලෝක වාතාවරණය, කොවිඩ් වසංගතයත් එක්ක බලපාලා තියෙන තත්ත්වය, සැපයුම් මාගර්වල තිබුණු බිඳ වැටීම වගේ මේ එකක්වත් සතහකටවත් සලකන්නේ නැතුව තමයි එදා ඔවුන් ඒ මනරම් කතා කළේ. මුලින්ම අපි අපේ හිත සුව පිණිස ඔවුන් ඒ දවස්වල මේ සම්බන්ධයෙන් තෙල් මිල ඉහළ යාම සහ බලශක්ති අබර්ුදය ගැන දක්වපු මත කීපයකට අවධානය යොමු කරමු.’’

පැරණි හඬපටයක් වාදනය වන අතර එහි මෙසේ සඳහන් වෙයි...

“තෙල් මිල අඩු කරන්න බැරිද? පුලුවන්... ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මේ මාසේ වෙනකොට තෙල් ආනයනය කරලා ලංකාවට පෙට්‍රෝල්, ඩීසල්, ලාම්පුතෙල් ලීටරයක් ගොඩබාන මිල ගණන් තියෙනවා. හරි පැහැදිලිව ඒකේ කියනවා ඔවුන්ගේ වාතර්‍ාවලම; “පෙට්‍රල් 92 ලීටරයක් ගොඩබාන මිල රුපියල් 97යි සත 70ක්. ඒකට විවිධ අයකිරීම් එකතු වෙනවා. ඒ එකතු කිරීමට අමතරව ආණ්ඩුව සෘජුව බද්දක් ගහනවා රුපියල් 39යි සත 33ක්. එතකොට පෙට්‍රල් 92 වලට රුපියල් 39.33ක බද්දක් ගහනවා. පෙට්‍රල් 95 ලීටරේ ගොඩබන මිල රුපියල් 99යි සත 79යි, ආණ්ඩුව සෘජු බද්දක් ගහනවා රුපියල් 60යි සත 45ක්. ලංකා ඔටෝ ඩීසල් 94යි සත 21ට ගොඩබන්නේ; රුපියල් 13යි සත 7ක බද්දක් ගහනවා. ලංකා සුපර් ඩීසල් ගොඩබන්නේ රුපියල් 96යි සත 2 කට; රුපියල් 35යි සත 20ක බද්දක් ගහනවා. එතකොට එහෙමනම් ” *(විජිත හේරත්)*

දෙවන හඬපටය වාදනය කරවයි.....

“දැන් මේ තෙල් මිල අඩු කරන්න පුළුවන්. අද මේ තෙල් වලට රුපියල් 50 බද්දක් ගහනවාට අමතරව තව බදු ගොඩක් එකතු වෙනවා. “100ට වැඩිය බද්දක් තියෙනවා”. තෙල් සංස්ථාවෙන් ණය පවරා ගත්තා භාණ්ඩාගාරය. දැන් තෙල් සංස්ථාවට ණය තිබ්බා. ඒ ණය පංගුව ගත්තා භාණ්ඩාගාරය. දැන් තෙල් සංස්ථාව ණය වෙන්නේ කාටද? භාණ්ඩාගාරයට. දැන් මොකද කරන්නේ? තෙල් සංස්ථාව විකුණන හැම පෙට්‍රල්, ඩීසල් ලීටරයකටම රුපියල් 50ක් ගන්නවා භාණ්ඩාගාරය ණයට හිලව් වෙන්න. මරු අයිඩියා එක.” *(අනුර දිසානායක)*

තෙවන හඬපටය වාදනය වෙයි...

“ගොඩබානකොට පෙට්‍රල් ලීටරයක් රුපියල් 42යි සත 70යි. ඩීසල් ලීටරය ගොඩබාන මිල රුපියල් 32යි සත 8යි. අපි 10%ක් සාධාරණ ලාභයක් එක්ක අපි 10ක් දැම්මොත්, පෙට්‍රල් ලීටරයක් රුපියල් 52කටත්, ඩීසල් ලීටරයක් රුපියල් 42කටත් ලබාදෙන්න පුළුවන්. කෙසේ වුවද අද පෙට්‍රල් විකුණුම් මිල රුපියල් 117ක් වෙනවා.” *(අනුර දිසානායක)*

සිව්වන හඬපටය වාදනය වෙයි...

"ආහාර, අධ්‍යාපන, සෞඛ්‍ය උපකරණ සඳහා තියෙන වැට් බද්ද අපි ඉවත් කරන්න ඕනේ. සම්පූර්ණයෙන්. සම්පූර්ණයෙන්. මොකද අපේ රටේ 2003 ඉඳන් 2023ක් වෙනකම් අවුරුදු 20ක් වැට් බද්ද තිබුණා. මේ අවුරුදු 20ටම පාසල් උපකරණ, ආහාර, වෛද්‍ය උපකරණවලට බද්ධ තිබුණේ නැහැ. අවුරුදු 20කට පස්සේ තමයි ගිය අවුරුද්දේ මේ බද්ධ ගැහෙන්නේ. කෙනෙක් ලෙඩ වුණාම බෙහෙත් පරීක්ෂණයක් කරන්න වෙනකොට බද්දට යටත් වෙන එක වැරදියි. දරුවට උගන්නන උපකරණයක් ගන්න එක බද්දක් කරන නිසා." *(අනුර දිසානායක)*

පස්වන හඬපටය වාදනය වෙයි...

"වතර්මානයේ ජාත්‍යන්තර වශයෙන් මතු වෙලා තියෙන යුදමය තත්ත්වය අපි නිමර්ාණය කරපු එකක් නෙවෙයි; ඒක නිමර්ාණය වෙච්ච එකක්. ඒක අපේ සීමාවෙන් එහා තියෙන්නේ. ඒක කොතනට වධර්නය වෙයිද කියන කාරණය සම්බන්ධයෙන් අපිට කාටවත් පැහැදිලි අනාවැකියක් කියන්න අමාරුයි. ඉතින් දැනට තියෙන තත්ත්වය තුළ අපිට සමත් වෙලා තියෙනවා - අපේ හාමුදුරුවෝ සමත් වෙලා තියෙනවා ඒ ආථර්ිකය කළමනාකරණය කරගන්න. මම හිතන්නේ ජනාධිපතිතුමා කිව්වා, පාලර්ිමේන්තුවේදීත් කිව්වා මේ කියන තත්ත්වය මත අපි කළ යුත්තේ කුමක්ද කියලා." *(ටිල්වින් සිල්වා)*

නැවත වීරවංශ මහතා කතා කරයි

"දානවා නම් දිගටම අහගෙන ඉන්නත් පුළුවන්. ඒ තරම් ෂෝක් කතා කියලා තියෙනවා විරුද්ධ පක්ෂයේ ඉන්දෙද්දී. දැන් එදා කිව්වනේ තෙල් ගොඩබානකොට තියෙන මිලයි, ගහන බද්දේ ප්‍රමාණයයි. බද්ද අඩු කළාම තෙල් මිල අඩු කරන්න පුළුවන් කියලා එදා පෙන්නුවේ සූර සරදිලා වගේ. ඉතින් ඒ "සූර සරදියල්ලා නේද දැන් ආණ්ඩුව කරන්නේ?" දැන් එදා අනුන්ට කියපු ඒ කතාව - බද්ද අඩු කරන එක - ඇයි අද කරන්න බැරි?

අපි විශ්වාස කරන්න ඕනේ එදා ජේවීපි එකද, අද ජේවීපි එකද? එදා බද්ද අයින් කරලා තෙල් මිල අඩු කරන්න පුළුවන් මාවත රටට හෙළිපෙහෙළි කරපු ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ අද බද්ද තියාගෙන, බද්ද තවත් වැඩි කරගෙන, අයින් කරනවා කියපු බදුත් අලුතෙන් ගහලා. අර නොරොච්චෝල බලාගාරයේ වෙච්ච මහා මංකොල්ලයෙන් වෙන පාඩුවත් තෙල් මිලෙන් ගන්නකොට, ඒක මිනිස්සුන්ගේ පිට පටවලා අතිශය විශාල ලාභ පංගුවක් හොයනවා.

දැන් බලන්න මේගොල්ලෝ මීට කලින් කිව්වේ මේ මාසයේ ලෝක වෙළඳපොළේ තෙල් මිල ගැලපෙන්නේ ලබන මාසෙට කියලා. දැන් මේ මාසයේම ඊට කලින් තෙල් මිලේ වෙනසක් කළා. එතකොට මේ මාසේ නැවත සූත්‍රය දාලා තෙල් මිල වෙනස් වෙන්න විදිහක් නැහැ. එතකොට මේ මාසේ

ලෝක වෙළඳපොළේ වැඩිවීමක් තියෙනවා නම්, ඇත්තටම ඔය කියන දවසට වඩා දැන් අඩුයි. එකසිය ගණන්වලට තිබ්බ්ච බැරල් එක දැන් 80 ගණන්වලට අඩු වෙලා තියෙනවා. ඩොලර් 80 ගණන්වලට.

එතකොට දැන් ඒ අඩුවීම ගැන කතා කරන්නේ නැහැ. මේ අය තමයි කිව්වේ 'මේ මාසේ තියෙන මිල ලබන මාසෙටයි අපි ගලපන්නේ' කියලා. එතකොට දැන් මේගොල්ලොන්ගේ සංචිතවල තෙල් තිබුණා. ඒ වගේම ආවේ පරණ මිලට. ඊළඟට පෙට්‍රල් ෂෙඩ් වල - ඒ කියන්නේ අපි දන්නවා IOC එකේ ගත්තත්, පෙට්‍රෝලියම් එකේ ගත්තත් - දවස් 20ක හෝ ප්‍රමාණයකට අඩුම තරමේ තෙල් තියෙනවා පරණ මිලට ගෙනාපු.

අනිත් පැත්තෙන් රටේ ස්ටෝරේජ් වල - අපි දන්නවා හැම ෂෙඩ් එකකටම තියෙනවා ස්ටෝරේජ් ටැංකියක්. ඔය ටැංකි ඔක්කොම ගත්තොත් ඔය මිල වැඩි කරන වෙලාවේ ලීටර් මිලියන 600ක් - 650ක ප්‍රමාණයක් තැන්පත් වෙලා තියෙනවා පරණ ගෙනාපු මිලට. එතකොට ලීටර් මිලියන 600 - 650 ප්‍රමාණය පමණක් ගණනය කරලා බලන්න, රුපියල් 23න් වැඩි කරලා කීයක් එනවද කියලා. ''රුපියල් බිලියන 15කට වැඩි අතිරික්ත ලාභයක් හොයනවා'' මම මේ කියන අර ස්ටෝරේජ් වල දාගෙන තියෙන පරණ ඉන්ධන ටිකෙන් විතරක්.

මෙතන ගණන් හදලා නැහැ පෙට්‍රෝලියම් එකේ සංචිතයේ තිබ්බ්ච ටොන් ප්‍රමාණය. එහෙම නැත්නම් IOC එකේ සංචිතවල තිබ්බ්ච ප්‍රමාණය ගණන් හදලා නැහැ. ඒවා නැතුව පෙට්‍රල් ෂෙඩ් වල තිබ්බ්ච සංචිත විතරක් බැලුවත් රුපියල් බිලියන 15කට වැඩි අතිරේක ලාභයක්, අතිරේක ලාභයක් ඒ ටිකෙන් විතරක් ලබනවා. එතකොට මෙතන මේ කරන්නේ... ඒ කියන්නේ හිතක් පපුවක් නැති ජාවාරම්කාරයෙක් හැසිරෙන විදිහටනේ ආණ්ඩුව මේ හැසිරෙන්නේ.

ලෝකයේ වෙච්ච තෙල් මිලේ වැඩිවීම දැන් ඒක ආයේ පහළට එනවා. ඒක වෙන්න ඕනේ ඊළඟ මාසේදී; ගලපා ගන්න ඕනේ. තමන් මිලදී ගන්නකොට තිබ්බ්ච මිල. දැන් මේක මඟ එන නැවේ ගානටත් හිතලා, හදලා ගහනවා. ඒකෙන් ජනාධිපති හරි බබා වගේ අහනවා 'මට තෙල් ළිං තියෙනවද? මට තෙල් සමාගම් තියෙනවද?' කියලා. ඔයාට නෙමෙයි. මේ රට පාලනය කරපු කාටවත් තෙල් ළිං තිබ්බෙත් නැහැ, තෙල් සමාගම් තිබ්බෙත් නැහැ. ඔයා නිකන් 'මට තෙල් ළිං තියෙනවද, තෙල් නළ තියෙනවද, සමාගම් තියෙනවද' කියලා ''බබා පාටර් එක දාන්න එපා''.

මේ කළේ අන්තිම හිරිකිත වැඩක්. මිනිස්සුන්ට කියනවා ''පරිභෝජනය අඩු කරන්න'' ලු. පරිභෝජනය ලැල්ලටම අඩු කරලා තියෙන්නේ. මීට වඩා අඩු කළොත් ඉතින් පරිභෝජනයක් නැහැ, සීරෝ. ඒ නිසා තෙල් විතරක් නෙමෙයි, අනිත් හැම පරිභෝජනයක්ම ඒ තරම් අමාරුවෙන් මිනිස්සු ජීවිතය ගෙවන්නේ.

බොරු කප්පරක් කියලා, බලාපොරොත්තු කන්දක් මවලා, තෙල් වලට ගහලා තියෙන බද්ද අඩු කරන හැටි කියලා, අධ්‍යාපන සෞඛ්‍ය උපකරණවලට බදු ගහන්නේ නැති හැටි පෙන්නලා, වැට් එක ගහන්නේ නැහැ කියලා පෙන්නලා, දැන් ඉතාම සුහවාදී බලාපොරොත්තු හදලා බලය අරගෙන දැන් කියනවා 'මට තෙල් ළිඳකුත් නැහැ, තෙල් සමාගමකුත් නැහැ' කියලා.

හැබැයි මේ විදිහට බිලියන ගණනින් අතිරේක ලාභ හොයන්න දෙන්නේ සමාගම් පිනවන්න මිසක් වෙන දේකට නෙවෙයි. ඒකෙන් එන සන්තෝසම කාටද යන්නේ, කීයද යන්නේ කියලා තමයි අපි හොයන්න ඕනේ. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් කියනවා තමුන්ට තෙල් ලිං නැහැ, තෙල් සමාගම් නැහැ කියලා නහයෙන් අඬ අඬා ඉන්නේ නැතුව, විරුද්ධ පක්ෂයේ හිටපු කාලේ කිව්ව විදිහට ඔය තෙල් වලට තියෙන "අතිශය විශාල බද්ද අයින් කරලා", ඔය තෙල් වලට ගහලා තියෙන අයුක්තිසහගත බදු බර අයින් කරලා - අන්න එහෙම කරලා පුළුවන් නම් අපිට එදා කිව්ව විදිහට කරලා පෙන්වන්න.

අපි නෙවෙයිනේ එදා කිව්වේ, ඔබතුමාන්ලානේ. ඔබතුමාන්ලා තමයි ඒ ක්‍රමය කිව්වේ. ආන්න ඒ ක්‍රමයට මේ මිල අඩු කරලා මේ රටේ පාරිභෝගිකයාට දෙන්න. අතිරික්ත අයුතු ලාභයක් ලබන්න දීපු අවස්ථාව වහාම නතර කරන්න. ඒ අතිරේක අයුතු ලාභ ලබන්න ගත්තු අවස්ථාව වහාම නතර කරන්න. ඒ නිසා මේ රටේ බලශක්ති අබර්‍ුදයක් අද හදලා තියෙනවා.

අද කාටත් නොකියා පවර් කට් එකක් යනවා. පූවර් අනතුරු ඇඟවීම් නැහැ. 'හදිසි විසන්ධි වීම්' කියලා පවර් කට් එකක් යනවා. ඇයි? "නොරොච්චෝලේ නියම ධාරිතාවය උපදවන්නේ නැහැ". ඒ අඩු වෙන ටික කොහෙන් හරි හොයන්න ඕනේ. හොයන්න බැහැ. අඩු වෙන ටික පද්ධතියෙන් කපලා දානවා. නොදන්නවා වගේ එක එක තැන්වල එක එක වෙලාවල් වලට විදුලිය එන එක ඇන හිටිනවා. ඒ තමයි අර නොරොච්චෝලේ විදුලිය අඩුවෙන් උපදින එකේ ප්‍රමාණය විදුලිය කැපිල්ලක් බවට පත් කරලා තියෙන්නේ.

මෙහෙන් විදුලිය කපනවා - දරුවෝ ඉගෙන ගන්න බැරුව රෑට කරුවලේ ඉන්නවා. මෙහෙන් අයුක්ති සහගත ලෙස හිතු හිතු මනාපයට රුපියල් විසි ගණනින් ඉන්ධන මිල වැඩි කරනවා. ඒ සියලු පීඩනය මහජනයාට දීලා 'අනේ අපිට තෙල් ලිං නැහැ, අපිට තෙල් සමාගම් නැහැ' කියලා බබා පාටප් එක දානවා. ඒ නිසා කරුණාකරලා ඔය බබා පාටප් එකෙන් මේ අබර්‍ුදය පියවන්න බැහැ. එදා විරුද්ධ පක්ෂයේදී කියපු විසඳුම තමුන්නාන්සේලාට දැන් බලයට ඇවිල්ලා ඉන්නේ, කරලා පෙන්වන්න. එහෙම නැතුව නහයෙන් අඬලා මේ රටේ ජනතාව නළවන්න පුළුවන් කියලා තමුන්නාන්සේලා හිතන්න එපා."

***<u>දේශනයේ දෙවන හෙළිදරව්ව.</u>***

“ අපේ රටේ රාජ්‍ය බුද්ධියංශයේ හිටපු ප්‍රධානී “සුරේශ් සලේ මහතා” තමුන් නාන්සේලා දන්නවා මේ වනවිට “දින 90කට වඩා වැඩි කාලයක්” ඩී ඕ ගහලා (Detention Orders) ජනාධිපතිගේ බලතල යටතේ ඩී. ඕ. ගහලා, නිසි පරිදි අධිකරණය දැනුම්වත් කිරීමකින් තොරව රඳවා තබාගෙන ඉන්නවා. මුල් කාල පරිච්ඡේදය තුළ ඔහු පොලීසියේ “ඒ” කාඹරයක තමයි නතර කරගෙන තිබුණේ. ඒ කාඹරයේ යම් අවම පහසුකම් ප්‍රමාණයක් වත් තිබුණා.

නමුත් ශානි අබේසේකර බලාපොරොත්තු වෙන විදියේ ප්‍රකාශයක් ඔහුගෙන් නොලැබීම මත, දැන් මොකද කරලා තියෙන්නේ? විශ්‍රාමික මේජර් ජෙනරල් සුරේශ් සලෙයි මහත්මයාව සම්පූර්ණර්යෙන්ම දාලා තියෙන්නේ “ඉතා අපිරිසිදු හිර කුටියකට”. ඒ හිර කුටිය තුළ මීයන් ඇඟ උඩින් දුවනවා. ඒ අපිරිසිදු බව කොච්චරද කියනවා නම් “දූවිලි පිරිච්ච පොළොවේ” තමයි පත්තර කෑල්ලක් දාගෙන රෑට නිදාගන්න සිද්ධ වෙලා තියෙන්නේ”.

අඩුගානේ මේ නිදාගන්න පැදුරක් දෙන්න නැති තරමට රහස් පොලීසියේ “අලුගෝසුවෝ” ටික තුච්ච වෙලා තියෙනවා, අමානුෂික වෙලා තියෙනවා. ඒ විතරක් නෙවෙයි, නිදාගන්න පැදුරක් නැති එක විතරක් නෙවෙයි, අන්තිම ගඳ ගහන අපිරිසිදු වැසිකිළියක් තියෙනවා ඊට යාබදව. ඒ ගඳ නිසා කන්න කටට ගන්න කෑම වේල කන්න බැරුව ඉන්නවා. කැවොත් ඒ කෑම වේල වමනය දාන තත්ත්වයට පත්වෙලා තියෙනවා.

මේ හදන්නේ මුන්දැලා සුරේශ් සලෙයිව හිර කුටිය ඇතුළෙම ජීවිතය එපා කරවලා මරා දාන තත්ත්වයකට ඇදලා දාන්නයි. මේ රටේ රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානියා වෙලා හිටපු, තමිල් සෙල්වම්ලට උඩින් පහරදෙන්න අවශ්‍ය තොරතුරු සපයලා දීපු, එදා යුද්ධය පවතින වෙලාවේ “රාජ්‍යයේ ඇස” හැටියට ක්‍රියාත්මක වුණු, මේ රටේ මිනිස්සු මරාගෙන මැරෙන බෝම්බකාරයන්ගෙන් මැරෙන්න ගිය ඒවා නවත්ත ගත්තු, මේ රටේ මිනිස්සු මරාගෙන මැරෙන ලොරිවලින් ඇවිල්ලා ගහන්න හදන ඒවයෙන් නවත්ත ගත්තු, මේරටේ මිනිස්සු බස්වල, කෝච්චිවල පිපිරෙන බෝම්බවලින් කෑලි කෑලි ගිහිල්ලා මරණයට ලක්වෙන එක නවත්ත ගත්තු, ඒවා පූවර් තොරතුරු අරගෙන ඒවා බෙදා හැරලා ඒ මගින් රටේ නීතිය හා සාමය, ආරක්ෂාව ආරක්ෂා කරගත්තු… එහෙම බුද්ධි ප්‍රධානියාට තමයි අද මේ තුච්ච සහ අවමන් සහගත ලෙස කටයුතු කරන්නේ.

“ශානී අබේසේකර මහත්තයෝ, ඔහේ මේ කරන අපරාධයට වැහි නැති හෙන ගහන්නේ. ඔහේටයි ඔහුගේ ලොක්කාටයි”. මේ රටේ රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානියාව අරගෙන අපිරිසිදු, මීයන් පිරිච්ච හිර කුටියකට දාලා, අල්ලපු වැසිකිළියේ තුච්ච ගඳ හින්දා කටට ගත්තු කෑම ටික බඩට යන්නේ නැති තත්ත්වයකට පත් කරලා, “නිරාහාරව තියලා රෝගියෙක් කරලා මරා දාන්නයි මේ හදන්නේ”. මේ තුච්ච අපරාධයට ඉඩදීලා බලන් ඉන්නවද මේ රටේ මිනිස්සු? ශාන අබේසේකර කියන විශ්‍රාමික පොලිස්කාරයා, පැන්ෂන් ගිය ලොක්කා, ඒ අලුගෝසුවාට ඉඩ දෙනවද මේ විදියට අපේ බුද්ධි අංශ ප්‍රධානියෙක්ගේ ජීවිතයත් එක්ක සෙල්ලම් කරන්න?. එහෙම බලන් ඉන්නවා නම් අපි මොක්කුද?

ඒ නිසා අපි ඉල්ලනවා මේ රටේ ජනතාවගෙන්, මේ පාහර වැඩේ කරන්න ඉඩ දෙන්න බැහැ. හිර කූටියක් ඇතුළේ දාලා, හිඟන්නෙක් වගේ දාලා, කන්න ටික නැති කරලා, ලෙඩෙක් කරලා මරා දාන්න හදන මේ මිනීමරු උත්සාහයට ඉඩ තියන්න බැහැ. ඒ නිසා අපි රටේම ජනතාවට ඉදිරි දිනක ආරාධනා කරනවා "රහස් පොලීසිය ගාව නවතින්න.... ආයේ එන්න නෙවෙයි, නතර වෙන්න බලාගෙන එන්න". අපි ඒක සූදානම් කරලා තමුන්නාන්සේලාට ඉදිරියේදී කියනවා. බොහොම ස්තූතියි".